## ඔබේ ගොවිබිමට ජලය සපයන වේලිඔය ජල පෝෂක ප්‍රදේශයේ ඉඩම් ගොල්ෆ් පිටියකට අත්කර ගැනීම පිළිබඳව

# "මහජන විනිශ්චය සභාව"

### වර්ෂ 2012 වූ පෙබරවාරි මස 24 දින පෙ.ව 9.00 ට,

### හම්බේගමුව විහාරස්ථාන භූමියේදී පැවැත්වේ"

එදින ඉහත කරුණු සම්බන්ධයෙන් පක්ෂ/විපක්ෂ අදහස්, චෝදනා හා යෝජනා ඉදිරිපත් කිරීමට ඔබ සැමට ආරාධනා කරන්නෙමු.

## වේලිඔය සුරැකීමේ සංවිධානය

**සංවිධාන ශක්තිය**

වේලිඔය ඒකාබද්ධ ගොවි සංවිධානය
වේලිඔය සුරැකීමේ භික්ෂු එකමුතුව
නැගෙන තරු යෞවන සමාජය (කොටවෙහෙරමංකඩ)
පරිසර යුක්ති කේන්ද්‍රය
අනාගතය අපේ අතේ
ජාතික ධීවර සහයෝගිතා ව්‍යාපාරය
පරිසර සංරක්ෂණ භාරය
ප්‍රජා අභිලාශ ජාලය
ඉඩම් අයිතිය සඳහා වන ජනතා සංධානය



### වේලිඔය ආශ්‍රිත වනයේ වටිනාකම පිළිබඳව ඔබ දන්නවාද?

වේලිඔය ජල හැරවුම ආශ්‍රිත වනය අලිඇතුන්, වලසුන්, දිවියන් ඇතුළු දුර්ලභ හා ලංකාවටම ආවේණික වූ සත්ව විශේෂ මෙන්ම පැරණි ගස් කොළන් වලින් යුක්ත වූවකි.

සොරගුණේ කුඩා කතරගම දේවාලය අතීතයේ සිට බැතිමතුන්ගේ වන්-දනාමානයට පාත්‍රවූ පුදබිමක් වන නිසා එහි ඇති පුරාවිද්‍යාත්මක වටිනා කම අසීමිතයි.

### යෝජිත ගොල්ෆ් පිටිය වේලිඔය ප්‍රදේශයට හානිදායක වනබව ඔබ දන්නවාද?

ගොල්ෆ් පිටිය සඳහා වේලිඔය ජල පෝෂක ප්‍රදේශයේ අක්කර 623 ක ඉඩම් හා පවුල් 7000 ක් ජීවත් කරවන වේලිඔය ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම විනාශවී යයි.

ගොල්ෆ් පිටිය සඳහා විශාල ලෙස කෘමිනාශක හා අධික විෂ සහිත රසායනික ද්‍රව්‍ය යොදන අතර ඒ නිසා ප්‍රදේශවාසීන්ට පිළිකා, සමේ රෝග වැළඳීමේ අවදානම ඉහල යනවා මෙන්ම ජලජ මසුන් වඳවීමටද හේතුකාරක වේ.

පාරම්පරිකව භුක්ති විඳින නින්දගම් ඉඩම් ගොල්ෆ් පිටියට ලබා ගැනීමෙන් ඉඩම්වල අයිතිය විදේශීය සමාගම් අතට පත්වේ.

මේ තත්වය නිසා ගොල්ෆ් පිටියට එරෙහිව වාරිමාර්ග හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවද සිය විරෝධය පලකර ඇත.

*එසේ නම් ඔබට බත සපයන ගොවිබිම්වලට ජලය සපයන වනාන්තරය ගොල්ෆ් පිටියකට බිලිවනතුරු ඔබ නිහඬව බලා සිටිනවාද?*

# තීන්දුව ඔබ අතේ!